**අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2018**
**-----------------------------------------------------------**

## 1.1 මතය
**----------**

අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලද 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2018 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම
**-------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනය පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
-------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි සේවකයන්ගෙන් ලබාගන්නා සේවය වෙනුවෙන් ගෙවීම් කරන විට එය ගිණුම් තබන්නේ කෙසේද යන්න වර්ග 04ක් යටතේ සාකච්ඡා කර ඇත. ඉන් දෙවන කොටසින් වර්තමානයේ සේවය කිරීම වෙනුවෙන් සේවය අවසන් කිරීමෙන් පසුව කරන ගෙවීම් පිළිබඳ සාකච්ඡා කරනු ලබන අතර පාරිතෝෂිත ගෙවීම් මේ යටතේ සිදුකරනු ලබන ගෙවීමකි. ප්‍රමිතියේ සඳහන් පරිදි පාරිතෝෂිත ලෙස සේවකයින්ට අනාගතයේදී කරනු ලබන ගෙවීම් Actuarier කෙනෙකු මගින් Actuarial valuation සිදුකොට | 2018 වර්ෂ අවසාන ගිණුම් සැකසීමේදී, පෙර වර්ෂ වල මෙන්, එක් එක් සේවකයා සම්පූර්ණ කරන ලද වර්ෂ ගණන පාදක කරගනිමින්, පාරිතෝෂිත සඳහා වෙන් කිරීම කර ඇත. අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මේ වන විට ස්ථිර සේවකයින් 34 දෙනෙකු සිටින අතර, 2018 වර්ෂය අවසානය වන විට පාරිතෝෂිත ගෙවීමට හිමිකම් ලැබූ, වසර 05ක සේවය සම්පූර්ණ කල සේවකයින් කිසිවකු නොමැත. විද්‍යායතනය 2014 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර, ඒ අනුව ආරම්භයේ සිට මේ දක්වා සිටින සේවකයින් 07 දෙනෙකු සඳහා | ගිණුම් සැකසීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලවකටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ගණනය කල යුතුවේ. නමුත් විශ්වවිද්‍යාල විද්‍යායතනය එවැනි ගණනය කිරීමක් මගින් අනාගතයේදී ගෙවනු ලබන සේවක පාරිතෝෂිත ගණනය කිරීම සිදු කර නොතිබුණි. | පාරිතෝෂිත ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ 2019 නොවැම්බර් 20 දිනෙන් පසුවය.ඒ අනුව 2019 වර්ෂයේ සිට ගිණුම් සැකසීමේදී Actuarier කෙනෙකු මගින් ගණනය කොට, පාරිතෝෂිත සඳහා වෙන් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී එක් සිසුවෙකු ගෙන් රු.5,000 බැගින් පුස්තකාල තැන්පතු ලබාගෙන තිබූ අතර මෙලෙස තැන්පත් මුදල් අයකිරීම සඳහා විද්‍යායතනය විසින් නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. මෙලෙස පුස්තකාල තැන්පතු ලෙස සිසුන් 304 කින් ලබාගත් රු.1,520,000 ක මුදලක් 2018 දෙසැම්බර් මාසයේදී ස්ථිර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | අධ්‍යක්ෂක වරුන්ගේ සැසියකදී ගන්නා ලද තීරණයක් අනුව පුස්ථකාල තැන්පතු ලෙස එක් සිසුවකුගෙන් රු.5,000 ක් අය කර ඇත. මෙම මුදල පාඨමාලාව අවසානයේදී ආපසු ගෙවනු ලබන ලැබේ. ඉතා වටිනා පොත්පත් සිසුන් සඳහා පිටතට රැගෙන යෑමට ලබා දෙන බැවින්, එම පොතකට යම් හානියක් සිදු වුව හොත් එම හානිය ආවරණය කර ගැනීම සඳහා මෙම තැන්පතුවක් ලබා ගනී. මෙම මුදල ස්ථිර තැන්පතුවක ආයෝජණය කිරීම සඳහා කළමණාකරන මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර, පසුව 2018.05.08 දිනදීද, මෙසේ පුස්තකාල තැන්පතු අය කිරීම සඳහා කළමණාකරන මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | විධිමත් අනුමැතියක් ලබා ගෙන මුදල් අයකිරීම් සිදුකළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| සමාලෝචිත වර්ෂයේදී විද්‍යායතනය සතු රසායනාගාර සඳහා රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම | 2,244,838 | මිලදී ගත් රසායන ද්‍රව්‍ය විද්‍යායතනය සතු රසායනාගාර සඳහා ලබා දෙන මුත් රසායනාගාර තුල රසායන ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් වාර්තා කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොතිබූ අතර එම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වත්කම් හි රු.942,649ක රසායනාගාර තොග ශේෂයෙහි නිවැරදිතාව සම්බන්ධව තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය. | 2018 වර්ෂයේදී ඉගෙනුම් උපකරණ මිලදී ගැනීම සඳහා දරන ලද රු. 2,244,838 ක මුදලත් දරන ලද අතර, ඉන් පසු අස්වනු තාක්‍ෂණ හා ජලජ සම්පත් කළමණාකරන යන රසායනාගාර සඳහා රසායනා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.712,814 ක් දරා ඇත. මෙම රසායනාගාරයන්හි මේ වන විට ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් සඳහා රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබේ. | ගබඩා තොග ලැබීම් සහ නිකුත් කිරීම් සඳහා ලේඛන නඩත්තු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 754 | මුදල් වර්ෂයක් අවසානයේදී බඩුලේඛන පොත් තුලනය කර ඉතිරි ශේෂය ඊළග මුදල් වර්ෂයට ගෙනයායුතු වුවද විශ්ව විද්‍යාල විද්‍යායාතනයේ බඩු ලේඛන පොත් 2015 සිට 2018 දක්වා වාර්ෂිකව තුලනය කර නොතිබුණි. | මේ වන විට විද්‍යායතනයේ බඩු ලේඛණ පොත් තුලණය කොට ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | 3.1.6 සහ 3.2.7 ඡේද | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමුකල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | විද්‍යායතනය විසින් 2017 වර්ෂයේදී භාණ්ඩ සමීක්‍ෂණයන් සිදු කර ඇති අතර අදාල වාර්තා විගණන අංශය වෙත භාර දී ඇත. 2018 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්‍ෂණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, එම වාර්තාව ඉක්මණින් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධන පනත | වත්කම් බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට නියමිත නිලධාරීන් සෑම වර්ෂයකම මාර්තු 31 දිනට තත්ත්වය දැක්වෙන වත්කම් බැරකම් ප්‍රකාශ එම වර්ෂයේ ජූනි 30ට පෙර ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ ඉදිරිපත් කර නොතිබුණි. | විද්‍යායතනයේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අදාල නිලධාරීන්,මේ වන විට 1988 අංක 74 පනත ප්‍රකාරව, වත්කම් බැරකම් ප්‍රකාශ ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. | 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධන පනත පරිදි නියමිත දිනට වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගත යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,705,727ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,936,933 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,231,206 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම රු. 12,614,959 කින් වැඩිවී තිබියදී ආදායම රු. 16,846,166 කින් වැඩි වී තිබීම ඉහත ඌනතාවයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විද්‍යායතනයේ සේවක පිරිවැය, ගමන් වියදම්, සැපයුම් හා අවශ්‍යතා යන වියදම් කාණ්ඩ පිළි වෙලින් ඉකුත් වර්ෂයට වඩා සියයට13, සියයට50, හා සියයට49 කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය1:0.16 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:0.39ක් ලෙස අඩුවී තිබුණි. නමුත් ක්ෂණික වත්කම් අනුපාතය පෙර වර්ෂය හා සසඳන කළ1: 0.0310 සිට1: 0.234 දක්වා වර්ධනය තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015,2016 සහ 2017 වර්ෂ වලදී බඳවාගත් සිසුන් සඳහා 2017 වර්ෂයේදී පැවති විභාග දෙක සහ 2018 අප්‍රේල් මාසයේ පැවති විභාගය සමත් වීමේ ප්‍රතිශතය ඉතා අඩු මට්ටමක පැවතුණු හෙයින් දිගින් දිගටම මෙම විභාග අසමත් වීමට හේතුව සොයා බලා එයට පිළියම් යෙදීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | මෙම දත්තයන් නිවැරදි නොවේ. නිවැරදි තොරතුරු මත පදනම්ව සකසන ලද වාර්තාවක් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | සිසුන්ගේ නිපුනතා මට්ටම වැඩිදියුණු කිරීමට කටයුතු කලයුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාඨමාලා ඉගැන්වීමට හඳුන්වා දී ඇති Curriculum Modules අනුව 2018 වර්ෂයේ NVQ 5 හා NVQ 6 පළමු හා දෙවන සමාසික පාඨමාලා 08 ට අයත් Modules 236 තුළ අනිවාර්යයෙන් ආවරණය කළ යුතු පැය ගණනින් Modules 131 ක **ආවරණය නොවූ පැය ගණන** සියයට 11 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණු බැවින් පාඨමාලා වල ගුණාත්මක බාවය පිළිබඳ සෑහීමට පත්විය නොහැකි බව නිරීක්ෂණය විය. | මෙම දත්තයන්ද නිවැරදි නොවේ. නිවැරදි තොරතුරු මත පදනම්ව සකසන ලද වාර්තාවක් විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ | පාඨමාලාවල ගුණාත්මකභාවය රැකෙන පරිදි අවශ්‍ය දේශන පැය ගණන ආවරණය කළයුතු අතර විගණනයට ඉදිරිපත් කරන තොරතුරු නිවැරදිව හා කාලීනව ඉදිරිපත් කළ යුතුය |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 හි (ආ) ඡේදය ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් වෙනුවෙන් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදුකළ යුතු වුවත් අවස්ථා 03කදී රු.2,348,970 ක්වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනිම වෙනුවෙන් ඒපරිදි කටයුතු කර නොතිබුණි. | මේ අතුරින් කිහිපයක් සඳහා ගිවිසුම් ලබාගෙන ඇති අතර ඉදිරියේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 හි (ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | ඉදිකිරීම්වලට අදාලව අවසන් බිල්පත් ගෙවීමේදී ඉංජිනේරුවරයා ගෙන් වැඩ අවසන් කිරීමේ වාර්තාව සහ අයවීම් නොමැති බවට සහතිකය (Completion report and No Claim certificate) නොමැතිව ගෙවීම් කර තිබුණි | වැඩ නිම කර ඇති ඉදිකිරිම් සඳහා වැඩ අවසන් කිරිමේ වාර්තා සහ අයවීම් නොමැති බවට සහතික ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. | ගෙවීම් කිරීමේදි නිසි පරිදි සහතික ආදිය ලබාගෙන ගෙවීම් කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ සහකාර ලේඛකාධිකාරි තනතුර, ආධුනික කතිකාචාර්ය තනතුරු 07ක්, කළමනාකරණ සහකාර තනතුරු 02ක්, විද්‍යාගාර සහයක තනතුරු සහ නඩත්තු තාක්ෂණික ශිල්පී තනතුරු 04ක්වූ ස්ථිර කාර්ය මණ්ඩල තනතුරු හා තාවකාලික Demonstrator තනතුරු 04ක් ඇතුළුව තනතුරු 18 ක පුරප්පාඩු සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | නොපමාව පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති 2009(1) මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවද, විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ වී වසර 04 ක් ඉක්ම වී තිබුණද, විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | විශ්ව විද්‍යාල විද්‍යායතන සියල්ලම, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් පාලනය කරනු ලබන අතර, එහි අභ්‍යන්තර විගණක විසින් හා විශ්ව විද්‍යාල විද්‍යායතන සඳහා පත් කරන ලද විගණන උපදේශක වරයකු විසින් විගණන කටයුතු සිදු කරනු ලබයි. අදාල වාර්තා මේ සමග ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතුය |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යායතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. | 2010 දෙසැම්බර් 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, විද්‍යායතනය සඳහා විගණන හා කළමණාකරන කමිටුවක් පිහිටු වීමට වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය වෙත ඉල්ලීමක් කොට ඇත. ඒ අනුව ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව විද්‍යායතනය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල තම ක්‍රියාකාරී සැලැස්මෙහි ඊට අදාල ක්‍රියාකාරකම් ඇතුළත්කර තිබූ බවට හා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාගෙන තිබූ බවට හඳුනාගත නොහැකි විය. | මෙම විද්‍යායතනයේ අරමුණ සලකා බැලීමේදි තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලබා ගැනීම පිණිස ඍජු ලෙසම දායක නොවේ.කෙසේ නමුත් ඉදිරියේදී 2017.08.14 දිනැති අංක එන්.පී/එස්.සී.පී.17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව අනුගත වෙමින් කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව රාජ්‍ය ආයතන කටයුතු කළ යුතුය. |